# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 241 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 10/02/2024 පැය 1345

## මාධ්‍ය නිවේදනය

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොස්ගම පොලිස් ස්ථානය.**

2024.02.09 වන දින සවස් කාලයේ කොස්ගම පොලිස් වසමේ ඉහල කොස්ගම ප්‍රදේශයේදී කොස්ගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකරන ලද වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන සිරිනිවාසවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** කොස්ගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සහ මත්පෙති සමඟ සැකකාරියක් අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.**

2024.02.09 වන දින සවස් කාලයේ වත්තල පොලිස් වසමේ හැඳල ප්‍රදේශයේදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 ක් සහ මත් කරල් 83 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 45 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.** වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**